සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

## රසායන විද්‍යාව - I

02 S I

කාලය පැය දෙකයි

විභාග අංකය: ..............................

22 A/L අපි [ papers group ]

**උපදෙස් :-**

* ආවර්තිතා වගුවක් සපයා ඇත.
* මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 කින් යුක්ත වේ.
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත්ව කියවන්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයකින් (x) යොදා දක්වන්න.

සාර්වත්‍ර වායු නියතය R $= 8.314\ J K^{-1} mol^{-1}$ ඇවගාඩ්‍රෝ නියතය $N_A = 6.022\times10^{23}\ mol^{-1}$

ප්ලාන්ක්ගේ නියතය h $= 6.626\times10^{-34}\ J s$ ආලෝකයේ ප්‍රවේගය c $= 3\times10^{8}\ m s^{-1}$

01. පහත දී ඇති වගන්ති සලකන්න.

i. කැතෝඩය කුමන ද්‍රව්‍යයකින් සෑදුනු එකක් වුවත්, නලය තුළ ඇති වායුව කුමක් වුවත් කැතෝඩ කිරණ ස්වභාවයෙන් ඒකාකාර වේ.

ii. විද්‍යුතයෙහි මූලික අංශුව 'ඉලෙක්ට්‍රෝනය' ලෙස නම් කරන ලදී.

ඉහත ක්‍රියාවලීන්ට සම්බන්ධ වුවන් වන්නේ,

1) J.J.තොම්සන් , අර්නස්ට් රදර්ෆඩ්
2) නීල්ස් බෝර්, J.G. ස්ටෝනි
3) හෙන්රි බෙකරල් , ජේම්ස් චැඩ්වික්
4) J.J. තොම්සන්, J.G. ස්ටෝනි
5) අරනස්ට් රදර්ෆඩ්, J.J. තොම්සන්

02. ${}_{42}Mo$ සම්බන්ධයෙන් පහත කුමන වගන්තිය නිවැරදි වේද?

1) එහි උද්දිගංශ (කෝණික ගම්‍යතා) ක්වොන්ටම් අංකය ($l$), $l=0$ වන ඉලෙක්ට්‍රෝන 10 ක් ඇත.
2) එහි උද්දිගංශ (කෝණික ගම්‍යතා) ක්වොන්ටම් අංකය ($l$), $l=2$ වන ඉලෙක්ට්‍රෝන 9 ක් ඇත.
3) එහි චුම්භක ක්වොන්ටම් අංකය ($m_l$), $m_l=-2$ වන ඉලෙක්ට්‍රෝන 3 ක් ඇත.
4) එහි ප්‍රධාන ක්වොන්ටම් අංකය ($n$), $n=5$ සහ කෝණික ගම්‍යතා ක්වොන්ටම් අංකය ($l$), $l=0$ වන ඉලෙක්ට්‍රෝන 2ක් ඇත.
5) එහි අවසාන ප්‍රධාන ශක්ති මට්ටමේ ඉලෙක්ට්‍රෝන 6 ක් පවතී.

CamScanner

03. $N^{3-}$, $O^{2-}$, $F^-$, $Na^+$ සහ $Al^{3+}$ යන අයනවල අරයන් වැඩිවන පිළිවෙළ වනුයේ,

1) $Al^{3+} < Na^+ < N^{3-} < F^- < O^{2-}$
2) $Al^{3+} < Na^+ < N^{3-} < O^{2-} < F^-$
3) $N^{3-} < O^{2-} < F^- < Na^+ < Al^{3+}$
4) $Al^{3+} < Na^+ < F^- < O^{2-} < N^{3-}$
5) $Al^{3+} < Na^+ < O^{2-} < F^- < N^{3-}$

04. $NH_3$, $SF_4$ හා $PCl_6^-$ හි ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතියන් පිළිවෙළින් වනුයේ,

1) පිරමිඩාකාර, සීසෝ හා අෂ්ටතලීය
2) පිරමිඩාකාර, තලීය සමචතුරස්‍රාකාර හා අෂ්ටතලීය
3) චතුස්තලීය, ත්‍රිආනති ද්විපිරමිඩාකාර හා අෂ්ටතලීය
4) චතුස්තලීය, තලීය සමචතුරස්‍රාකාර හා අෂ්ටතලීය
5) චතුස්තලීය, සීසෝ හා අෂ්ටතලීය

05. පහත දී ඇති සංයෝගයේ IUPAC නාමය කුමක් ද?



1) 1- ethoxy - 3 - formyl - 4 -hydroxybutan - 1- one
2) ethyl -3 - formyl - 4 - hydroxybutanoate
3) 1- ethoxy - 4 - hydroxy- 3- formylbutanoate
4) ethyl 3 - formyl - 4 - hydroxybutanoate
5) ethyl 4 - hydroxy - 3 - formylbutanoate

22 A/L අපි [ papers group ]

06. පහත කුමන වගන්තිය අසත්‍ය වේද?

1) $CH_4$ වල තාපාංකය > Xe වල තාපාංකය
2) K වල ද්‍රවාංකය < Ti වල ද්‍රවාංකය
3) Mn වල ද්‍රවාංකය > Zn වල ද්‍රවාංකය
4) $CH_3OH$ වල තාපාංකය < $C_2H_5OH$ වල තාපාංකය
5)  වල තාපාංකය < $CH_3CH_2CH_2CH_2OH$ වල තාපාංකය

07. $M(OH)_2$ යනු ජලයෙහි මඳ වශයෙන් ද්‍රාව්‍ය ප්‍රබල විද්‍යුත් විච්ඡේද්‍යයකි. 298 K දී $M(OH)_2$ හි සංතෘප්ත ජලීය ද්‍රාවණයක pH අගය 6.0 කි.

298 K $1.0\times10^{-2}$ mol dm$^{-3}$ $MCl_2$ ද්‍රාවණයක දී $M(OH)_2$ හි ද්‍රාව්‍යතාවය වනුයේ

1) $2.5\times10^{-23}$ mol dm$^{-3}$
2) $5.0\times10^{-23}$ mol dm$^{-3}$
3) $7.07\times10^{-12}$ mol dm$^{-3}$
4) $3.535\times10^{-12}$ mol dm$^{-3}$
5) $1.414\times10^{-11}$ mol dm$^{-3}$

08. නිවැරදි ප්‍රකාශනය වනුයේ,

1) $CH_4$, $NH_3$, $H_2O$ හා $H_2S$ හි බන්ධන කෝණයන් $CH_4 > NH_3 > H_2S > H_2O$ යන පිළිවෙළට අඩුවේ.

2) $O_2$, $O_3$ හා $H_2O_2$ හි O-O බන්ධන දිග $H_2O_2 < O_3 < O_2$ යන පිළිවෙලට වැඩිවේ.

3) $\dot{N}O_2$, $NO_3^-$, $NO_2^-$ හා $NH_3$ හිදී N වල විද්‍යුත් සෘණතාව $\dot{N}O_2 > NO_3^- > NO_2^- > NH_3$ ලෙසට අඩුවේ.

4) $Na_2CO_3$, $MgCO_3$, $CaCO_3$ වල තාප වියෝජන හැකියාව $Na_2CO_3 > MgCO_3 > CaCO_3$ ලෙසට අඩුවේ.

5) $CO_2$, $H_2O$ සහ $NH_3$ සැලකූ විට ද්විධ්‍රැව ඝූර්ණය $NH_3 < H_2O < CO_2$ ලෙසට වැඩිවේ.

09. 

(I) $LiAlH_4$ / වියළි ඊතර්
(II) $H^+/H_2O$
→ ඵල

ඉහත ප්‍රතික්‍රියාවේ ඵල වනුයේ,

1)  , $CH_3CH_2COOH$

2)  , $CH_3CH_2CH_2OH$

3)  , $CH_3CH_2COOH$

4)  , $CH_3CH_2CH_2OH$

5)  , $CH_3CH_2CH_2OH$

22 A/L අපි [ papers group ]

10. $2A(g) \rightarrow B(g) + 3C(g)$ යන ප්‍රතික්‍රියාවේ එක්තරා කාලයක දී B(g) අනුබද්ධයෙන් ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය $1.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$ වේ. A(g) ක්ෂයවීමේ ශීඝ්‍රතාවය හා C(g) සෑදීමේ ශීඝ්‍රතාවයන් පිළිවෙළින් වනුයේ,

1) $3.0\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$ සහ $4.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$

2) $0.75\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$ සහ $0.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$

3) $1.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$ සහ $1.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$

4) $0.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$ සහ $1.5\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$

5) $3.0\times10^{-3}$ mol $dm^{-3}$ $s^{-1}$ සහ $5.0\times10^{-4}$ mol $dm^{-3}$ $s^{-1}$

11. 

A හා B පිළිවෙලින් වනුයේ,

1) 

2) 

3) 

4) 

5) 

12. එක්තරා NaCl ද්‍රාවණයක ඝනත්වය $d\ g\ cm^{-3}$ වේ. එහි අඩංගු NaCl හි ස්කන්ධය අනුව ප්‍රතිශතය $\left(\frac{w}{w}\%\right)$ w% සහ අඩංගු NaCl හි මවුලික ස්කන්ධය $M\ g\ mol^{-1}$ නම් ද්‍රාවණයේ NaCl හි සංයුතිය ppm වලින් සහ ද්‍රාවණයේ සාන්ද්‍රණය $mol\ dm^{-3}$ වලින් වනුයේ,

1) $10^4w, \frac{10dw}{M}$

2) $dw \times 10^4, \frac{10dw}{M}$

3) $\frac{10^6w}{d}, \frac{10^3dw}{M}$

4) $10^4w, \frac{10^3dw}{M}$

5) $10^6dw, \frac{10^3dw}{M}$

22 A/L අපි [ papers group ]

13. නියත උෂ්ණත්වයක දී ජලීය ද්‍රාවණයක $HX(aq)+H_2O(l) \rightleftharpoons H_3O^+(aq)+X^-(aq)$ යන සමතුලිතතාවය පවතී. මෙම ද්‍රාවණයේ HX(aq) හි ආරම්භක සාන්ද්‍රණය C වන විට pH අගය x වේ. ද්‍රාවණයේ HX හි සාන්ද්‍රණය දස ගුණයකින් අඩුවන විට නව ද්‍රාවණයේ pH අගය වනුයේ,

1) $\frac{x}{\sqrt{10}}$

2) $10x$

3) $\frac{x}{10}$

4) $0.5+x$

5) $5+x$

14. $NO_2(g) + CO(g) \rightarrow NO(g) + CO_2(g)$ යන ප්‍රතික්‍රියාව පහත ප්‍රතික්‍රියා යාන්ත්‍රණය ඔස්සේ සිදුවේ.

පියවර I $NO_2(g) + NO_2(g) \xrightarrow{K_1} NO_3(g) + NO(g)$; සෙමෙන් සිදුවේ

පියවර II $NO_3(g) + CO(g) \xrightarrow{K_2} NO_2(g) + CO_2(g)$ ; වේගයෙන් සිදුවේ.

$K_1$ හා $K_2$ පිළිවෙළින් පියවර I හා පියවර II හි ශීඝ්‍රතා නියත වේ. මෙම ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය අසත්‍ය වේද? (K= ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතා නියතය)

1) ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාවය = $K[NO_2(g)]^2$ වේ.
2) $NO_3(g)$ හා $NO(g)$ ප්‍රතික්‍රියාව සිදුවීමේදී ප්‍රතික්‍රියා අතරමැදියන් ලෙස ක්‍රියා කරයි
3) වේග නිර්ණ පියවරෙහි ශීඝ්‍රතා නියමය, නිරීක්ෂිත ශීඝ්‍රතා නියමය හා සමාන වේ නම් $K_1 = K$ වේ.
4) $NO_3(g)$ ප්‍රතික්‍රියකවලට හා ඵලවලට වඩා අස්ථායි ය.
5) $CO(g)$ යාන්ත්‍රණයට සහභාගීවන්නේ වේග නිර්ණ පියවරට පසුව බැවින් එය ශීඝ්‍රතා නියමයට ඇතුළත් නොවේ.

15. ජලීය ද්‍රාවණයක $100.0 cm^3$ ක් පරිමාවක් තුළ අඩංගු X ද්‍රව්‍ය , ජලය හා අමිශ්‍ර කාබනික ද්‍රාවණයක $500.0 cm^3$ ක් සමග මිශ්‍රකරන ලදී. ජලය හා කාබනික ද්‍රාවකය අතර X හි විභාග සංගුණකය 10 කි. කාබනික ද්‍රාවකයේ $500.0 cm^3$ එකවර යෙදීමෙන් හා $250.0 cm^3$ කොටස් වශයෙන් දෙවරක් යෙදීමෙන් නිස්සාරණය කරගත හැකි X ප්‍රතිශතයන් පිළිවෙළින් වනුයේ (X වඩාත් දියවන්නේ කාබනික ද්‍රාවකය තුළය)

1) 95.01% සහ 96.03%
2) 95.01% සහ 98.03%
3) 95.01% සහ 99.85%
4) 96.03% සහ 98.85%
5) 98.03% සහ 99.85%

22 A/L අපි [ papers group ]

16. බෙන්සීන් $\xrightarrow{A}$ B $\xrightarrow{D}$ C $\xrightarrow{E}$ G $\xrightarrow{F}$ 


A ,D හා F ප්‍රතිකාරක පිළිවෙළින් වනුයේ,

1) නිර්ජලීය $AlCl_3 / CH_3Cl$, නිර්ජලීය $AlCl_3 / (CH_3)_3CCl$ , $H^+ / KMnO_4$
2) නිර්ජලීය $AlCl_3 / CH_3COCl$, නිර්ජලීය $AlCl_3 / (CH_3)_3CCl$ , $H^+ / KMnO_4$
3) නිර්ජලීය $AlCl_3 / (CH_3)_3CCl$, නිර්ජලීය $AlCl_3 / CH_3COCl$ , $H^+ / KMnO_4$
4) නිර්ජලීය $AlCl_3 / CH_3Cl$, $H^+ / KMnO_4$ නිර්ජලීය, $AlCl_3 / (CH_3)_3CCl$
5) නිර්ජලීය $AlCl_3 / CH_3COCl$, Zn(Hg) / සාන්ද්‍ර.HCl , $H^+ / KMnO_4$

CamScanner

17. 0.10 mol $dm^{-3}$ $M^{2+}(aq)$ ද්‍රාවණයක් හා 0.20 mol $dm^{-3}$ $N^{3+}(aq)$ ද්‍රාවණයක් සලකන්න. $Ksp\,[MX_2(s)] = 9.0\times10^{-9}\,mol^3\,dm^{-9}$ සහ $Ksp\,[NX_3(s)] = 1.6\times10^{-18}\,mol^4\,dm^{-12}$ වනවිට $N^{3+}(aq)$ අයන පමණක් අවක්ෂේප කිරීම සඳහා $X^-(aq)$ අයන වල කවර පරාසයක් භාවිත කළ හැකි ද?

1) $3.0\times10^{-4}\,mol\,dm^{-3} < [X^-(aq)] < 2.0\times10^{-6}\,mol\,dm^{-3}$

2) $9.0\times10^{-4}\,mol\,dm^{-3} < [X^-(aq)] < 1.6\times10^{-6}\,mol\,dm^{-3}$

3) $2.0\times10^{-6}\,mol\,dm^{-3} < [X^-(aq)] < 3.0\times10^{-4}\,mol\,dm^{-3}$

4) $0.3\times10^{-3}\,mol\,dm^{-3} < [X^-(aq)] < 0.2\times10^{-3}\,mol\,dm^{-3}$

5) $2.0\times10^{-4}\,mol\,dm^{-3} < [X^-(aq)] < 3.0\times10^{-6}\,mol\,dm^{-3}$

18. $Na_2CO_3.10H_2O$ $1.43\times10^{-3}\,g$ ක ස්කන්ධයක් ආස්‍රැත ජලය 250.0 $cm^3$ ක දියකර සාදාගත් ද්‍රාවණයේ ඝනත්වය 1.2 g $cm^{-3}$ වේ. ද්‍රාවණයේ $Na^+$ හි සංයුතිය ppm (mg $kg^{-1}$) වලින් වනුයේ,

(Na=23, C= 12, O=16, H=1)

1) 47.67    2) 0.3825    3) 4.77    4) 0.767    5) 76.67

19. MgO(s) හි උත්පාදන එන්තැල්පිය සෙවීමට අවශ්‍ය බොන් හේබර් චක්‍රය නිර්මාණය දී අවශ්‍ය නොවන එන්තැල්පි විපර්යාසය වනුයේ,

1) Mg (s) හි ඌර්ධවපාතන එන්තැල්පිය

2) O (g) හි පළමු ඉලෙක්ට්‍රෝනය ලබාගැනීමේ එන්තැල්පිය

3) Mg (g) හි සජලන එන්තැල්පිය

4) Mg (g) හි පළමු අයනීකරණ එන්තැල්පිය

5) MgO (s) හි දැලිස් විඝටන එන්තැල්පිය

20. මෙතේන් ක්ලෝරිනීකරණයේ දාම ප්‍රචාරන පියවරක් නොවන්නේ, පහත කුමන පියවර ද?

1) $\dot{C}H_3 + Cl_2 \longrightarrow CH_3Cl + \dot{C}l$

2) $\dot{C}H_2Cl + Cl_2 \longrightarrow CH_2Cl_2 + \dot{C}l$

3) $CH_4 + \dot{C}l \longrightarrow \dot{C}H_3 + HCl$

4) $\dot{C}H_3 + \dot{C}l \longrightarrow CH_3Cl$

5) $CH_2Cl_2 + \dot{C}l \longrightarrow \dot{C}HCl_2 + HCl$

22 A/L අපි [ papers group ]

CS CamScanner

21. වායුවල හැසිරීම සම්බන්ධයෙන් මින් කුමක් සත්‍ය වේද?

1) අවධි උෂ්ණත්වයට ඉහළ උෂ්ණත්වයකදී ඉහළ පීඩනයක් යෙදීමෙන් පමණක් වායුවක් ද්‍රව කළ හැක.

2) වායු අණුවල මධ්‍යයන වේගය, පීඩනය වැඩිවන විට වැඩිවේ.

3) වායු අණුවල මධ්‍යයන චාලක ශක්තිය තාපගතික උෂ්ණත්වයට ප්‍රතිලෝමව සමානුපාතික වේ.

4) එකම උෂ්ණත්වයේදී හා පීඩනයේ දී වායුවක ඝනත්වය එහි මවුලික ස්කන්ධයට ප්‍රතිලෝමව සමානුපාතික වේ.

5) වායුවක සම්පීඩ්‍යතා සාධකය යනු දෙන ලද උෂ්ණත්වයක දී සහ පීඩනයක දී වායුවක් පරිපූර්ණ ලෙස හැසිරේ නම් එහි මවුලික පරිමාව සහ සත්‍ය මවුලික පරිමාවත් අතර අනුපාතය වේ.

22. අසංශුද්ධ ඩොලමයිට් ($CaCO_3.MgCO_3$) සාම්පලයකින් 2.0g වැඩිපුර 1.0 mol $dm^{-3}$ HCl ද්‍රාවණ 100.0 $cm^3$ ක් සමග ප්‍රතික්‍රියා වීමට සලස්වන ලදී. ප්‍රතික්‍රියාවට පසු ලැබුණු ද්‍රාවණය උදාසීන කිරීමට 2.0 mol $dm^{-3}$ NaOH ද්‍රාවණ 30.0 $cm^3$ ක් අවශ්‍ය විය. සාම්පලයේ අඩංගු ඩොලමයිට් වල ප්‍රතිශත සංශුද්ධතාවය වනුයේ, (සා.ප.ස්. Ca= 40.0 , Mg = 24.0, C= 12.0, O = 16.0)

1) 92 2) 88 3) 50 4) 42 5) 46

23. 300 K දී $O_2$ වායුවේ වර්ග මධ්‍යනය වේගය, 450 K දී X නම් වායුවේ වර්ග මධ්‍යනය වේගයට සමාන වේ. X හි මවුලික ස්කන්ධය g $mol^{-1}$ වලින් වනුයේ (සා.ප.ස් O=16)

1) 44 2) 30 3) 48 4) 28 5) 64

24. 298 K උෂ්ණත්වයක දී 1.0 mol $dm^{-3}$ $NH_3(aq)$ ද්‍රාවණ 40.0 $cm^3$ ක් 2.0 mol $dm^{-3}$ HCl(aq) ද්‍රාවණ 10.0 $cm^3$ ක් සමඟ මිශ්‍රකරණ ලදී. (ද්‍රාවණ මිශ්‍රකිරීමේදී පරිමා වෙනසක් නොවේ යයි සලකන්න.) ලැබෙන ද්‍රාවණයේ pH අගය වනුයේ

298 K දී $K_{b(NH_3)} = 1.8\times10^{-5}$ mol $dm^{-3}$

$K_w = 1.0\times10^{-14}$ $mol^2$ $dm^{-6}$

1) 5.74 2) 5.26 3) 4.74 4) 9.26 5) 8.26

25. $CH_3\overset{O}{\overset{\|}{C}}CH_2CH_2CO_2H \xrightarrow{NaBH_4 / CH_3OH} P \xrightarrow{PCl_3} Q \xrightarrow{\text{වැඩිපුර } NH_3} R$

මෙම ප්‍රතික්‍රියා දාමයේ P, Q හා R පිළිවෙළින් වනුයේ,

1) $CH_3CH(OH)CH_2CH_2CH_2OH$ $CH_3\overset{Cl}{\overset{|}{C}}HCH_2CH_2CH_2Cl$ $CH_3\overset{NH_2}{\overset{|}{C}}H\ CH_2CH_2CH_2NH_2$

2) $CH_3COCH_2CH_2CH_2OH$ $CH_3CO\ CH_2CH_2CH_2Cl$ $CH_3CO\ CH_2CH_2CH_2NH_2$

3) $CH_3CH(OH)CH_2CH_2CO_2H$ $CH_3\overset{Cl}{\overset{|}{C}}H\ CH_2CH_2CO_2H$ $CH_3\overset{NH_2}{\overset{|}{C}}H\ CH_2CH_2CONH_2$

4) $CH_3\overset{OH}{\overset{|}{C}}H\ CH_2CH_2CO_2H$ $CH_3\overset{Cl}{\overset{|}{C}}H - CH_2CH_2COCl$ $CH_3\overset{NH_2}{\overset{|}{C}}H\ CH_2CH_2CONH_2$

5) $CH_3\overset{OH}{\overset{|}{C}}H\ CH_2CH_2CO_2H$ $CH_3\overset{Cl}{\overset{|}{C}}H - CH_2CH_2COCl$ $CH_3\overset{NH_2}{\overset{|}{C}}H\ CH_2CH_2COCl$

22 A/L අපි [ papers group ]

CamScanner

26. සෝඩියම් (Na) මූලද්‍රව්‍යය හා එහි සංයෝග සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය අසත්‍ය වේ ද?

1) පහන්සිළු පරීක්ෂාවේ දී සෝඩියම් සංයෝග දීප්තිමත් කහ දැල්ලක් ලබාදෙයි.

2) $Na_2CO_3(s)$ තාපයට ස්ථායී වන අතර $NaHCO_3(s)$ තාපය හමුවේ වියෝජනය වී $Na_2CO_3(s)$, $CO_2(g)$ හා $H_2O(g)$ ලබා දෙයි.

3) Na වැඩිපුර ඔක්සිජන් හමුවේ ප්‍රතික්‍රියාවෙන් ප්‍රධාන ඵලය ලෙස $NaO_2(s)$ ලබා දෙයි.

4) $NaNO_3(s)$ තාපය හමුවේ වියෝජනය වී වායුවක් ලෙස $O_2(g)$ පමණක් ලබාදෙයි.

5) $NaH(s)$ අයනික වන අතර ජලය සමග ප්‍රතික්‍රියා වී $NaOH(aq)$ සහ $H_2(g)$ ලබා දෙයි.

27. ආම්ලික මාධ්‍යයේ දී $FeC_2O_4$ හා $K_2Cr_2O_7$ අතර ප්‍රතික්‍රියාවේදී හුවමාරු වන සම්පූර්ණ ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව වන්නේ,

1) 1    2) 6    3) 2    4) 3    5) 12

28. හරිතාගාර ආවරණය, අම්ල වැසි හා ප්‍රකාශ රසායනික ධූමිකාවට හේතුවන වායුන් පිළිවෙළින් අඩංගු වන පිළිතුර වන්නේ,

1) $CH_4(g)$, $CO_2(g)$, $NO(g)$
2) $SO_2(g)$, $CO_2(g)$, $CH_4(g)$
3) CFC, $SO_3(g)$ $NO(g)$
4) $H_2O(g)$, $NO_2(g)$, $N_2(g)$
5) $NO_2(g)$, $SO_2(g)$, $CH_4(g)$

22 A/L අපි [ papers group ]

29. පහත කුමන ප්‍රකාශය සත්‍ය වේද?

1) කැටායනයේ විශාලත්වය අඩුවන විට ධ්‍රැවීකාරක බලය අඩුවේ.

2) සම ඉලෙක්ට්‍රෝනික ප්‍රභේදවල කැටායනයේ ආරෝපණය වැඩිවන විට ආරෝපණ ඝනත්වය වැඩිවේ.

3) ඇනායනයේ විශාලත්වය වැඩිවන විට ධ්‍රැවණශීලතාව අඩුවේ.

4) සම ඉලෙක්ට්‍රෝනික ප්‍රභේදවල දී ඇනායනයේ ආරෝපණය වැඩිවන විට ධ්‍රැවණශීලිතාව අඩුවේ.

5) බන්ධනයක ධ්‍රැවීකරණය වැඩිවන විට අයනික ලක්ෂණ වැඩිවේ.

30. මැන්ගනීස් (Mn) හා එහි සංයෝග සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

1) මැන්ගනීස්, ආම්ලික, භාස්මික මෙන්ම උභයගුණි ඔක්සයිඩ ද සාදයි.

2) ආම්ලික මාධ්‍යයේ ඇති $KMnO_4$ ද්‍රාවණයකට $H_2O_2$ එක්කළ විට ද්‍රාවණයේ වර්ණය වෙනස් වන අතර වායුවක් ද පිටවේ.

3) තනුක ක්ෂාරීය මාධ්‍යයේ $KMnO_4$ ද්‍රාවණයකට KI ද්‍රවණයක් එක්කළ විට තද දුඹුරු පැහැ අවක්ෂේපයක් ලැබේ.

4) ආම්ලික මාධ්‍යයේ $KMnO_4$ ද්‍රාවණයකට $H_2S$ වායුව බුබුලනය කළ විට පැහැදිලි අවර්ණ ද්‍රාවණයක් ලැබේ.

5) ක්ෂාරීය මාධ්‍යයේ $K_2MnO_4$ ද්‍රාවණයකට $H_2O_2$ ද්‍රාවණයක් එක් කළ විට තද දුඹුරු පැහැ අවක්ෂේපයක් ලැබෙන අතර වායුවක් ද පිටවේ.

CamScanner

❖ a,b,c,d ප්‍රකාශන ප්‍රශ්න සඳහා පහත උපදෙස් සම්පිණ්ඩනය භාවිතා කරන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (a) හා (b) පමණක් නිවැරදි ය | (b) සහ (c) පමණක් නිවැරදිය | (c) සහ (d) පමණක් නිවැරදිය | (d) සහ (a) පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් පමණක් හෝ වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ නිවැරදිය |

31. පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේද?

a) $Na_2CO_3$ නිෂ්පාදනයේ සෝල්වේ ක්‍රමයහි අමුද්‍රව්‍ය වන්නේ $NH_3(g)$,$CO_2(g)$ හා බ්‍රයින් ද්‍රාවණයයි.

b) ඇමෝනියා නිෂ්පාදනයේ හේබර් බොෂ් ක්‍රමයේදී ඉතා ඉහළ පීඩනයක් යෙදීමෙන් $NH_3$ එලදාව වැඩිකර ගෙන ඇත.

c) නයිට්‍රික් අම්ල නිෂ්පාදනයේ ඔස්වල්ඩ් ක්‍රමයේදී අමුද්‍රව්‍ය ලෙස $N_2(g)$ වායුගෝලීය වාතය හා ජලය භාවිතා කරයි.

d) යකඩ නිෂ්පාදනයේ දී කොක් ඉන්ධනයක් ලෙස, ඍජු ඔක්සිහාරකයක් ලෙස හා ප්‍රධාන ඔක්සිහාරකය වූ CO ජනනයට යොදා ගැනේ.

32. A හා B ද්‍රව එකිනෙක සමග පරිපූර්ණ ද්‍රාවණ සාදයි. A හා B 1 mol ක් බැගින් සංවෘත භාජනයක් තුළ මිශ්‍ර කරනු ලැබේ. පරීක්ෂණාත්මක තත්ත්ව යටතේ දී සංශුද්ධ A හා සංශුද්ධ B හි වාෂ්ප පීඩන පිළිවෙළින් 12 kPa හා 14 kPa වේ. සමතුලිත අවස්ථාවේදී ද්‍රව කලාපයේ A හා B හි මවුල භාග පිළිවෙළින් $X_A$ හා $X_B$ ද , වාෂ්ප කලාපයේ A හා B හි මවුල භාග පිළිවෙළින් $Y_A$ හා $Y_B$ වේ නම්, පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේ ද?

a) $X_A=X_B$ b) $Y_B>Y_A$ c) $X_A>X_B$ d) $Y_A>Y_B$

33. පහත සඳහන් ප්‍රකාශවලින් කුමන ප්‍රකාශය/ ප්‍රකාශ සත්‍ය වේද?

a) Pt ඉලෙක්ට්‍රෝඩ යොදා ජලීය $CuSO_4$ ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනයදී කැතෝඩය මත Cu ලෝහය තැන්පත් වේ.

b) Pt ඉලෙක්ට්‍රෝඩ යොදා ජලීය $CuSO_4$ ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනයදී ඇනෝඩයෙන් $O_2$ වායුව මුක්ත වේ.

c) Pt ඉලෙක්ට්‍රෝඩ යොදා ජලීය $Na_2SO_4$ ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනයදී ඇනෝඩයෙන් $SO_2$ වායුව මුක්ත වේ.

d) Cu ඉලෙක්ට්‍රෝඩ යොදා ජලීය $CuSO_4$ ද්‍රාවණයක් විද්‍යුත් විච්ඡේදනයදී ද්‍රාවණයේ $Cu^{2+}_{(aq)}$ ජලීය සාන්ද්‍රණය නියතව පවතී.

34. $CH_3CH_2MgBr$ පහත කුමන සංයෝගය/ සංයෝග සමග ප්‍රතික්‍රියාවෙන් $CH_3CH_3$ (එතේන්) ලබා දෙයි ද?

a) $CH_3NH_2$ b) $CH_3-\overset{\overset{\displaystyle O}{\|}}{C}-H$ c) $CH_3COCH_3$ d) $NH_3$

22 A/L අභි [ papers group ]

CS CamScanner

35. සංවෘත භාජනයක් තුළ නියත උෂ්ණත්වයේ දී පහත සඳහන් සමතුලිතතාව පවති.
$2A(g) + 2B(g) \rightleftharpoons C(g) + 2D(g)$ මෙම සමතුලිත පද්ධතියට C(g) බාහිරින් එක් කර නැවතත් එම උෂ්ණත්වයේදීම පද්ධතිය සමතුලිතතාවයට එළඹීමට ඉඩ හැරිය විට එම සමතුලිත පද්ධතිය සම්බන්ධව පහත කුමන ප්‍රකාශය/ ප්‍රකාශ සත්‍ය වේ ද?

a) D(g) ආංශික පීඩනය අඩු වී ඇත.
b) B(g) ප්‍රමාණය වැඩි වී ඇත.
c) බඳුන තුළ සමස්ත පීඩනය අඩු වී ඇත.
d) C(g) ආංශික පීඩනය අඩු වී ඇත.

36. පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ අසත්‍ය වේද?

a) ඕසෝන් වියනේ හායනයට මිනිස් ක්‍රියාකාරකම් හේතු වෙන් වායුගෝලයට එකතු වන වාෂ්පශීලි සංයෝග ද හේතු වේ.
b) ඕසොන් වියන හායනයට දායක වන ප්‍රධානම සංයෝග කාණ්ඩය වනුයේ ක්ලෝරෝෆ්ලුවොරො කාබන්ය.
c) ස්වභාවික හේතු මගින් ඕසෝන් වියනට සිදුවන හානිය ස්ථිර වේ, මේ හේතුවෙන් සිදු වූ හානිය නැවත යථා තත්ත්වයට පත් නොවේ.
d) ඕසෝන් වියනේ පැවැත්ම නිසා හානිකර අධෝරක්ත කිරණ පෘථිවි පෘෂ්ඨයට පැමිණීම වළකාලයි.

37. සල්ෆර් සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?

a) සල්ෆර් වල සුලබතම බහුරූපි ආකාරය රොම්බසිය සල්ෆර් වේ.
b) රොම්බසිය සල්ෆර් සහ ඒකානති සල්ෆර් යන දෙවර්ගයම ස්ඵටිකරූපි ආකාර වේ.
c) රොම්බසිය සල්ෆර් සහ ඒකානති සල්ෆර් යන බහුරූපී ආකාර 2 ම ඔටුනු හැඩයේ $S_8$ චක්‍රවලින් සමන්විත වේ.
d) $95^0C$ ට ඉහළ උෂ්ණත්වලදී සල්ෆර් වල වඩාම ස්ථායී බහුරූපී ආකාරය රොම්බසිය සල්ෆර් වේ.

38. පහත දී ඇති ජලයේ දර්ශීය තාපන වක්‍රය සම්බන්ධයෙන් පහත කුමන වගන්තිය/ වගන්ති නිවැරදි වේද?




22 A/L අපි [ papers group

a) $H_2O(s) \rightleftharpoons H_2O(l)$ සමතුලිතතාව AB රේඛාව මගින් දැක්වේ.
b) ඉහත වක්‍රයට අනුව $\Delta H_{fus} < \Delta H_{vap}$ වේ.
c) $H_2O(l) \rightleftharpoons H_2O(g)$ සමතුලිතතාව BC රේඛාව මගින් දැක්වේ.
d) ප්‍රස්ථාරයේ QA, BC හා DE රේඛා මගින් කලාප සංක්‍රමණ සිදුවන අවස්ථා පෙන්නුම් කරයි.

CamScanner

39. ව්‍යාප්ති සංගුණකය $K_D$ (න'න්ස්ට් ව්‍යාප්ති නියමය) යෙදීමට පහත කුමන තත්ත්වය/තත්ත්ව අවශ්‍ය වේද?

a) ද්‍රාවක දෙකෙහිම ද්‍රව්‍යයේ සාන්ද්‍රණය වැඩිවිය යුතුය.
b) පරීක්ෂණය සිදුකරන කාලය තුළ දී උෂ්ණත්වය නියතව පැවතිය යුතුය.
c) ද්‍රාවක දෙක තුළ ද්‍රව්‍යය එකම අණුක ස්වභාවයෙන් පැවතිය යුතුය.
d) පරීක්ෂණය සිදුකරන කාලය තුළ දී උෂ්ණත්වය නියතව පැවතීම අත්‍යාවශ්‍ය නොවේ.

40. ජෛව ඩීසල් සම්බන්ධයෙන් අසත්‍ය වන්නේ,

a) ජෛව ඩීසල් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයකි.
b) ජෛව ඩීසල් කාර්මිකව නිපදවීමේදී ලැබෙන ප්‍රධාන අතුරු ඵලය ග්ලිසරෝල්ය
c) ජෛව ඩීසල් යනු මේද අම්ල වල සෝඩියම් ලවණ වේ.
d) ජෛව ඩීසල් නිෂ්පාදනයේදී සිස් එස්ටරීකරණ ප්‍රතික්‍රියාව මගින් ඉහළ ඵලදාවක් ලබාගැනීමට හා ඉහළ සංශුද්ධතාවයක් පවත්වා ගත හැක.

❖ 41 සිට 50 දක්වා උපදෙස් සම්පිණ්ඩනය භාවිතා කරන්න

| පළමු වැනි වගන්තිය | දෙ වැනි වගන්තිය |
|---|---|
| (1) සත්‍ය ය | සත්‍ය වන අතර, පළමුවැන්න නිවැරදි ව පහදා දෙයි |
| (2) සත්‍ය ය | සත්‍ය වන නමුත්, පළමුවැන්න නිවැරදි ව පහදා නොදෙයි |
| (3) සත්‍ය ය | අසත්‍ය වේ |
| (4) අසත්‍ය ය | සත්‍ය වේ |
| (5) අසත්‍ය ය | අසත්‍ය වේ |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 41 | $NH_3(g)$ වැඩිපුර $Cl_2(g)$ වායුව සමග ප්‍රතික්‍රියාවෙන් $N_2(g)$ හා $HCl(g)$ ලැබේ. | $NH_3$ වායුව ඔක්සිකාරකයක් මෙන්ම ඔක්සිහාරකයක් ලෙස ද ක්‍රියාකරයි. |
| 42 | පීඩන උදුනකදී ජලයේ තාපාංකය $100\,^0C$ ට වඩා වැඩිවේ. | පීඩන උදුන ඇතුලත පීඩනය 1 atm වලට වඩා වැඩිවේ. |
| 43 | $Cl_2$ වායුව උණු සාන්ද්‍ර NaOH සමග ප්‍රතික්‍රියාවෙන් NaCl සහ NaOCl ලබා දෙයි. | $Cl_2$ වායුවට ඔක්සිකාරකයක් මෙන්ම, ඔක්සිහාරකයක් ලෙස ද ක්‍රියාකළ හැක |
| 44 | උත්ප්‍රේරකයක් යෙදීමෙන් ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාවය වැඩිකරගත හැක. | උත්ප්‍රේරකයක් අඩු සක්‍රියන ශක්තියෙන් යුතු විකල්ප මාර්ගයක් ප්‍රතික්‍රියාවට සපයයි. |
| 45 |  ජලීය NaOH සමග ප්‍රතික්‍රියාවෙන් ඵලය ලෙස  පමණක් සාදයි. |  සතුව $\alpha$ - හයිඩ්‍රජන් ඇත. |
| 46. | පොලිඑතිලීන් ටෙරිතැලේට් (PET) හි පුනරාවර්තන ඒකකය  වේ. | පොලිඑතිලීන් ටෙරිතැලේට් සෑදෙන්නේ ටෙරිතැලික් අම්ලය හා එතලීන් ග්ලයිකෝල් සංඝනන බහු අවයවීකරණයෙනි. |

22 A/L අපි [ papers group ]

CS CamScanner

| | | |
|---|---|---|
| 47. | ෆීනෝල මෙන්ම කාබොක්සිලික් අම්ලද $Na_2CO_3$ සමග ප්‍රතික්‍රියාවෙන් $CO_2$ වායුව පිටකරයි. | ෆීනොල් වලට සාපේක්ෂව ෆීනොක්සයිඩ් අයනයේ ස්ථායිතාව කබොක්සිලික් අම්ලයට සාපේක්ෂව කාබොක්සිලේට් අයනයේ ස්ථායිතාවට වඩා වැඩිය. |
| 48. | බෙන්සීන් ඩයසෝනියම් ක්ලෝරයිඩ් ජලීය NaOH හමුවේ β - නැප්තෝල් (2-නැප්තෝල්) සමග ප්‍රතික්‍රියාවෙන් රතු පැහැ  සංයෝගය සාදයි. | බෙන්සීන් ඩයසෝනියම් ක්ලෝරයිඩ් ස්ථායිව පවතිනුයේ 0-5$^0$C අතර උෂ්ණත්වයක දීය. |
| 49. | 0.10 mol $dm^{-3}$ $CH_3COOH$ අම්ල ද්‍රාවණ 25.0 $cm^3$ කට, 0.05 mol $dm^{-3}$ NaOH ද්‍රාවණ 25.0 $cm^3$ ක් එක් කළ විට ලැබෙන ද්‍රාවණය ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකරයි | දුබල අම්ලය මෙන් ම එහි සංයුග්මක භස්මයද ඇති ද්‍රාවණයක් ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කරයි. |
| 50. | සන්නායකතාව අපජල තත්ත්ව පරාමිතියකි | පිරිසිදු ජලයේ සන්නායකතාව ඉහළ අගයක් ගනියි. |

22 A/L අපි [ papers group ]

| period | 1* | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | 57 La | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | 89 Ac | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Ds | 111 Rg | 112 Cn | 113 Nh | 114 Fl | 115 Mc | 116 Lv | 117 Ts | 118 Og |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| lanthanoid series 6 | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| actinoid series 7 | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
Practice Test - Grade 13 - 2022

# රසායන විද්‍යාව - II

02 S II

කාලය පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: ..............................................

- A කොටස ව්‍යුහගත රචනා
  - * සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
  - * ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතුය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.
- B කොටස සහ C කොටස - රචනා
  - * එක් එක් කොටසින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
  - * සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A,B** සහ C කොටස් තුනකට පිළිතුරු A කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුර පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
  - * ප්‍රශ්න පත්‍රයෙහි **B** සහ **C** කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

22 A/L අපි [ papers group ]

## A - කොටස ව්‍යුහගත රචනා

01. a) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද නැතහොත් අසත්‍ය ද යන බව තිත් ඉරි මත සඳහන් කරන්න. හේතු අවශ්‍ය නැත.

i) කැටායනවල ධ්‍රැවීකරණ බලය සහ ඇනායනවල ධ්‍රැවණශීලිතාව හා සම්බන්ධ නීති, NaI වල ද්‍රවාංකය KCl හි ද්‍රවාංකයට වඩා අඩු බව පුරෝකථනය කරයි. ..........................

ii) ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය ආවර්තයක් ඔස්සේ වඩාත් ධන වන අතර, කාණ්ඩයක් ඔස්සේ පහළට සෘණ අගය අඩුවේ. ..........................

iii) $2\times10^6\ m\,s^{-1}$ වේගයෙන් ගමන් කරන ඉලෙක්ට්‍රෝනයක ඩී-බ්‍රෝග්ලී තරංග ආයාමය $2\times10^5\ m\,s^{-1}$ වේගයෙන් ගමන් කරන ඉලෙක්ට්‍රෝනයක ඩී-බ්‍රෝග්ලී තරංග ආයාමයට වඩා ඉහළ අගයක් ගනී. ..........................

iv) O වල සංයුජතා ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණය (Z සඵල) F, වල සංයුජතා ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණයට වඩා අඩු වේ. ..........................

v) පොස්පොරික් අම්ලයේ ($H_3PO_4$) සියලු P-O බන්ධන දිගින් සමානය. ..........................

b) i) $N_2O_3$ අණුව සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත්- ඉරි ව්‍යුහය අඳින්න. එහි සැකිල්ල පහත දක්වා ඇත.




ii) ඉහත (i) හි අඳින ලද ව්‍යුහයේ නයිට්‍රජන් පරමාණු දෙකෙහි ඔක්සිකරණ අවස්ථා දෙන්න. නයිට්‍රජන් පරමාණු පහත දක්වා ඇති ආකාරයට සළකුණු කර ඇත.




$N^1$ ..............................................................

$N^2$ ..............................................................

iii) $SO_5^{2-}$ අයනය සඳහා වඩාත්ම ස්ථායි ලුවිස් තිත්- ඉරි ව්‍යුහය පහත දක්වා ඇත. මෙම අයනය සඳහා තවත් ලුවිස් තිත්- ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) තුනක් අඳින්න.



22 A/L අපි [ papers group ]

iv) පහත සඳහන් ලුවිස් තිත්-ඉරි ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.





| | | $N^2$ | $C^3$ | $O^4$ | $C^5$ |
|---|---|---|---|---|---|
| i | පරමාණුව වඩා VSEPR යුගල් | | | | |
| ii | පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | |
| iii | පරමාණුව වටා හැඩය | | | | |
| iv | පරමාණුවේ මුහුම්කරණය | | | | |

කොටස් (v) සිට (viii) , ඉහත (iv) කොටසෙහි දෙන ලද ලුවිස් තිත්- ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iv) කොටසෙහි ආකාරයටම වේ.

v) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\sigma$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක /මුහුම් කාක්ෂික හඳුනා ගන්න.

i. $N^2 - C^3$ $N^2$.................... $C^3$....................

ii. $N^2 - O^1$ $N^2$.................... $O^1$....................

iii. $C^3 - O^4$ $C^3$.................... $O^4$....................

iv. $O^4 - C^5$ $O^4$.................... $C^5$....................

v. $C^5 - H^7$ $C^5$.................... $H^7$....................

vi. $C^3 - O^6$ $C^3$.................... $O^6$....................

vi) පහත දැක්වෙන පරමාණු දෙක අතර $\pi$ බන්ධන සෑදීමට සහභාගි වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

i. $O^1 - N^2$ $O^1$............................ $N^2$............................

ii. $C^3 - O^6$ $C^3$............................ $O^6$............................

vii) $N^2$,$C^3$,$O^4$ සහ $C^5$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න.

$N^2$ :- ................................. $C^3$ :- .................................

$O^4$ :- ................................. $C^5$ :- .................................

viii) $O^4$, $O^6$, $N^2$, $C^3$ සහ $C^5$ පරමාණු විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙලට සකසන්න.

..............<...........<...........<.............<..........

c) i) සෝඩියම් වාෂ්ප ලාම්පුවකින් විමෝචනය වන කහ ආලෝකයේ සංඛ්‍යාතය $5.10\times10^{14}$ Hz වේ. මෙහි ෆෝටෝන 1.5 mol ක අඩංගු ශක්තිය ගණනය කරන්න.

ප්ලාන්ක් නියතය $h = 6.63\times10^{-34}$ J s

ආලෝකයේ ප්‍රවේගය $C = 3\times10^{8}$ m s$^{-1}$

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

22 A/L අපි [ papers group ]

ii) $AX_4$ යන සූත්‍රය ඇති අණුවක A-X $\sigma$ බන්ධන හතරක් අඩංගුය. මෙහි A සහ X මූලද්‍රව්‍යවල සංකේත නිරූපණය කරන අතර, A මධ්‍ය පරමාණුවේ පහත දී ඇති I සහ II හිදි $AX_4$ සඳහා තිබිය හැකි අණුක හැඩය/ හැඩයන් නම් කරන්න.

i. $AX_4$ ධ්‍රැවීය නම් : ........................................

ii. $AX_4$ නිර්ධ්‍රැවීය නම් : ........................................

iii) ඉහත I හා II යටතේ ඔබ සඳහන් කර ඇති හැඩවලට එක් උදාහරණයක් බැගින් දෙන්න.

(සැ.යු. අණුක සූත්‍ර අවශ්‍ය වේ)

$AX_4$ ධ්‍රැවීය : ........................................................................................................................

$AX_4$ නිර්ධ්‍රැවීය : ........................................................................................................................

22 A/L අපි [ papers group ]

02. පහත දී ඇති ප්‍රශ්න [(a) - (d)] A,B,C,D, හා E ලෙස නම් කර ඇති මූලද්‍රව්‍ය/ විශේෂ (ප්‍රභේද) හා සම්බන්ධවයි.

a) A සහ B යනු s ගොනුවේ මූලද්‍රව්‍යයන් ය. එහි පරමාණුක ක්‍රමාංකය 20 ට අඩු ය. B ජලය සමග ගිනි ගැනීමක් සහිතව ප්‍රබල ලෙස ක්‍රියා කරන අතර, A ජලය සමග ප්‍රබල ලෙස ක්‍රියා කරයි. A හා B යන දෙදෙනාම ජලය සමග ප්‍රබල භාස්මික ද්‍රාවණ සාදමින් වායුවක් පිටකරයි. A වැඩිපුර $O_2(g)$ සමග ප්‍රධාන ඵලය ලෙස පෙරොක්සයිඩය සාදයි. B වැඩිපුර $O_2(g)$ සමග ප්‍රධාන ඵලය ලෙස සුපර් ඔක්සයිඩය සාදයි.

i) A හා B හි රසායනික සංකේත ලියන්න.

A ...................................... B ......................................

ii) A හා B හි සම්පූර්ණ ඉලෙක්ට්‍රෝන වින්‍යාසයන් ලියන්න.

A : ......................................

B : ......................................

iii) ජලය සමග A සහ B ප්‍රතික්‍රියා කළ විට පිටවන වායුව නම් කරන්න. ..........................................................

iv) පහන්සිළු පරීක්ෂාවේදී A හා B ලබාදෙන වර්ණයන් කුමක් ද?

A ...................................... B ......................................

v) A හා B සඳහා පහත දක්වන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

A + වැඩිපුර $O_2(g)$ - ..........................................................................................

A + $H_2O(l)$ - ..........................................................................................

B + වැඩිපුර $O_2(g)$ - ..........................................................................................

B + $H_2O(l)$ - ..........................................................................................

vi) A හි ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය, ආවර්තිතා වගුවේ එම ආවර්තයේම යාබද කාණ්ඩයේ මූලද්‍රව්‍යයේ එම අගයට වඩා වැඩි හෝ අඩුවේද? ඔබගේ පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

vii) A හා B ස්වාභාවිකව පවත්නා එක් ආකාරයක් බැගින් ලියන්න.

A .................................... B ....................................

b) C යනු X සහ Y යන මූල ද්‍රව්‍ය දෙක පමණක්, පිළිවෙළින් 1:4 අනුපාතයෙන් අඩංගු ඇනායනයකි. X ආවර්තිතා වගුවේ d ගොනුවේ මූලද්‍රව්‍යයක් වන අතර Y P ගොනුවේ මූලද්‍රව්‍යයකි. C හි දී X එහි උපරිම ඔක්සිකරණ අවස්ථාවේ පවතී.

X හි විද්‍යුත් සෘණතාව Y හි විද්‍යුත් සෘණතාවයට වඩා අඩුය. C ඇනායනය භාස්මික මාධ්‍යයේදී උභයගුණි ඔක්සයිඩයක් බවට ඔක්සිහරණය කළ හැක.

i) C හි රසායනික සූත්‍රය, ආරෝපණයද ඇතුළත්ව ලියන්න. ..............................................................

ii) C හි ලුවිස් තිත් - ඉරි ව්‍යුහය අඳින්න.

22 A/L අපි [ papers group ]

iii) C හි මධ්‍ය පරමාණුවේ ඔක්සිකරණ අවස්ථාව දෙන්න. ..............................................................

iv) C ආම්ලික මාධ්‍යයේදී $C_2O_4^{2-}$ (aq) අයන සමග දක්වන ප්‍රතික්‍රියාවට අදාල තුලිත අයනික සමීකරණය ලියන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

v) ඉහත (iv) කොටසෙහි දැකිය හැකි සියලු නිරීක්ෂණ ලියන්න. වායුවක් පිටවේ නම් එම වායුව හඳුනා ගැනීමට රසායනික පරීක්ෂාවක් දෙන්න.(සැ.යු. නිරීක්ෂණය/ නිරීක්ෂණද අවශ්‍ය වේ.)

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

vi) කැටායනය ලෙස B හා ඇනායනය ලෙස C ඇති සංයෝගය F හි රසායනික සූත්‍රය ලියන්න.

..............................................................................................................................................

c) D යනු අයනික සංයෝගයකි, එය 1:1:3 අනුපාතයෙන් ඇති මූලද්‍රව්‍ය 3කින් සමන්විත වේ. D හි එක් මූලද්‍රව්‍යයක් A වන අතර, අනෙක් මූලද්‍රව්‍ය දෙක ආවර්තිතා වගුවේ p - ගොනුවට අයත් වේ. මෙම මූලද්‍රව්‍ය දෙකෙන් එකක් C හි ද අඩංගු වේ. මෙම මූලද්‍රව්‍යවලින් එකක ඒක පරමාණුක ඇනායනය ජලීය මාධ්‍යයේදී පිටකරන වායුව නෙස්ලර් ප්‍රතිකාරකය දුඹුරු පැහැගන්වයි.

i) D හි රසායනික සූත්‍රය ලියන්න. ..............................................................................................

ii) D හි අඩංගු ඇනායනය හඳුනාගැනීම සඳහා රසායනික පරීක්ෂාවක් දෙන්න.( සැ.යු නිරීක්ෂණය/ නිරීක්ෂණ ද අවශ්‍ය වේ)

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

d) F හි ජලීය ද්‍රාවණයක්, E ජලීය ද්‍රාවණයේ සාන්ද්‍රණය සෙවීමට භාවිතා කළ හැකි අතර E ජලීය ද්‍රාවණය ලා - කොළ පැහැයෙන් යුතු වන අතර d- ගොනුවේ මූලද්‍රව්‍යයකින් ව්‍යුත්පන්න වන කැටායනයකි.

i. E කැටායනය හඳුනාගන්න. ..........................................................................................

ii. මෙහි දී භාවිත වන අනුමාපන වර්ගය කුමක් ද? ..............................................................

iii. ඉහත අනුමාපනයේදී සිදුවන ඔක්සිකරණ, ඔක්සිහරණ අර්ධ ප්‍රතික්‍රියා සහ තුලිත අයනික ප්‍රතික්‍රියාව ලියන්න.

ඔක්සිකරණ අර්ධ ප්‍රතික්‍රියාව ..........................................................................................

ඔක්සිහරණ අර්ධ ප්‍රතික්‍රියාව ..........................................................................................

තුලිත අයනික ප්‍රතික්‍රියාව ..........................................................................................

iv. මෙම අනුමාපනයේදී සිදුවිය හැකි එක් ගැටලුවක් හඳුනාගෙන එම ගැටලුව මග හරවා ගැනීමට සිදුකරන ක්‍රියාවක් සඳහන් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

22 A/L අපි [ papers group ]

v. අන්ත ලක්ෂයේදී දක්නට ලැබෙන වර්ණ විපර්යාසය ලියන්න.

.................................................................................................................................

03. a) උෂ්ණත්වය T K $NH_3(aq)$ දුබල භස්මයේ විඝටන නියතය $K_b$ ද, එහි ආරම්භක සාන්ද්‍රණය $C\ mol\ dm^{-3}$ ද, මෙම උෂ්ණත්වයේදී ජලයේ විඝටන නියතය $K_w$ යයි සලකන්න.

i) $NH_3(aq)$ ද්‍රාවණය ජලය තුල දී පවත්නා සමතුලිතතාවයට අදාල ප්‍රතික්‍රියාව ලියන්න.

.................................................................................................................................

ii) $NH_3(aq)$ හි විඝටන නියතය $K_b$ සඳහා ප්‍රකාශනයක් ලියන්න.

.................................................................................................................................

.................................................................................................................................

iii) ඉහත ද්‍රාවණයේ pH සඳහා ප්‍රකාශනයක් ලබාගන්න. (ඉහත ආරම්භයේ දී ඇති දත්ත පමණක් භාවිතා කරන්න.)

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

iv) $25^0C$ දී 0.10 mol $dm^{-3}$ $NH_3(aq)$ ද්‍රාවණයක pH අගය ගණනය කරන්න.

$25^0C$ දී $K_b[NH_3] = 1.0\times10^{-5}$ mol $dm^{-3}$, $K_w = 1.0\times10^{-14}$ $mol^2$ $dm^{-6}$

v) 0.10 mol $dm^{-3}$ $NH_4Cl$ ද්‍රාවණයක $25^0C$ දී pH අගය සොයන්න.

22 A/L අපි [ papers group ]

vi) $25^0C$ දී 0.10 mol $dm^{-3}$ $NH_4Cl$ ද්‍රාවණයක 25.0 $cm^3$ කට 0.05 mol $dm^{-3}$ NaOH ද්‍රාවණ 25.0 $cm^3$ ක් එක් කරන ලදී. මෙම ද්‍රාවණයේ pH අගය සොයන්න.

vii) ඉහත (vi) හි ද්‍රාවණය ස්වාරක්ෂක ද්‍රාවණයක් ලෙස හැසිරේද / නොහැසිරේද යන්න කෙටියෙන් පහදන්න.

viii) $25^0C$ දී $0.10\ mol\ dm^{-3}$ $NH_4Cl$ ද්‍රාවණ $10.0\ cm^3$ කට $0.10\ mol\ dm^{-3}$ NaOH ද්‍රාවණ $10.0\ cm^3$ එක් කරන ලදී. මෙම ද්‍රාවණය ස්වාරක්ෂකයක් ලෙස හැසිරේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

b) 2A (aq) → 2B (aq) + C(g) ප්‍රතික්‍රියාවේ පෙළ සෙවීම සඳහා කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵල පහත වගුවේ දැක්වේ.

| පරීක්ෂණය | ආරම්භක [A(aq)] $mol\ dm^{-3}$ | ආරම්භක ශීඝ්‍රතාවය/ $mol\ dm^{-3}\ s^{-1}$ |
|---|---|---|
| 1 | $1.0 \times 10^{-2}$ | $3.2 \times 10^{-3}$ |
| 2 | $2.0 \times 10^{-2}$ | $6.4 \times 10^{-3}$ |
| 3 | $3.0 \times 10^{-2}$ | $9.6 \times 10^{-3}$ |

(i) ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතා නියතය k ද, A ට සාපේක්ෂ පෙළ a නම් ද ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව සඳහා ප්‍රකාශනයක් k හා a ඇසුරින් ලියන්න.

.....................................................................................................................................

(ii) a හි අගය සොයන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

22 A/L අපි [ papers group ]

(iii) k හි අගය සොයන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

(iv) A හි සාන්ද්‍රණය $2.0 \times 10^{-2}\ mol\ dm^{-3}$ වන විට තත්පර 1000 කට පසු A සාන්ද්‍රණය $6.25\times10^{-4}\ mol\ dm^{-3}$ විය. ප්‍රතික්‍රියාවේ අර්ධ ජීව කාලය සොයන්න.

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

04. a) P, Q, R, S සහ T යනු අණුක සූත්‍රය $C_5H_{10}O$ සහිත ව්‍යුහ සමාවයවික 5ක් වේ. ඉහත සංයෝග සියල්ලම 2,4- DNP සමග තැඹිලි අවක්ෂේපයක් ලබාදෙයි. P සහ T පමණක් $NH_4OH/AgNO_3$ සමග රිදී කැඩපතක් ලබා දෙයි. R සහ S එකිනෙකහි ස්ථාන සමාවයවික වන අතර P සහ T දාම සමාවයවික වේ. P සංයෝගය පමණක් ප්‍රකාශ සක්‍රිය සංයෝගයක් වේ. R සහ S සංයෝග ක්ලෙමන්සන් ඔක්සිහරණයෙන් එකම සංයෝගයක් වන A ලබා දෙයි. Q, $LiAlH_4$ සමග ප්‍රතික්‍රියාවෙන් පසු ලැබෙන ඵලය ජලවිච්ඡේදනයෙන් ලැබෙන B ඵලය ලූකස් ප්‍රතිකාරකය සමග මිනිත්තු 10 ක දී පමණ ආවිලතාවයක් ලබා දෙයි.

i) P, Q , R , S ,T A, සහ B වල ව්‍යුහයන් පහත දී ඇති කොටු තුළ අඳින්න.

P

Q

R

S

T

A

B

22 A/L අපි [ papers group ]

ii) පහත ප්‍රතික්‍රියාවල දී ලැබෙන ඵලයන් වල ව්‍යුහයන් ලියන්න.

I P




II T $\xrightarrow{\text{Zn(Hg) / සාන්ද්‍ර HCl}}$

b) පහත දක්වා ඇති ප්‍රතික්‍රියාවල I, J, K, L සහ M ඵලවල ව්‍යුහයන් දී ඇති කොටු තුළ අඳින්න.

i) 

$\xrightarrow{NaOH}$

I

ii) 

i) වැඩිපුර $C_2H_5MgBr$ /වියලි ඊතර
ii) $H^+/H_2O$

J

iii) 

සාන්ද්‍ර $H_2SO_4$ →

K

iv) 

(i) NaOH(aq)
(ii) $H^+ / \Delta$

L

v) 

$NaNO_2$ / dil HCl
$0 - 5^0C$

M

c) $CH_2=CHCH_3$ හා සාන්ද්‍ර $H_2SO_4$ අතර ප්‍රතික්‍රියාවට අදාල ලැබන ඵලය සහ ප්‍රතික්‍රියවේ යන්ත්‍රණය ලියා දක්වන්න. ලැබෙන ඵලය $H^+/H_2O/\Delta$ අදාල ප්‍රතික්‍රියාවේ ඵලයෙහි ව්‍යුහය ද ලියා දක්වන්න.

22 A/L අපි [ papers group ]

B- කොටස රචනා

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

05. a) i) පහත දැක්වෙන දත්ත භාවිතා කර

$2NO(g)+Cl_2(g) \rightarrow 2NOCl(g)$ යන ප්‍රතික්‍රියාවේ එන්තැල්පි විපර්යාසය ගණනය කරන්න.

$\Delta H^{\theta}_{D[N=O]} = +673\ kJ\ mol^{-1},\ \Delta H^{\theta}_{D[N-Cl]} = +365\ kJ\ mol^{-1},\ \Delta H^{\theta}_{D[Cl-Cl]} = +242\ kJ\ mol^{-1}$

ii) $CO(g)+Cl_2(g) \rightarrow COCl_2(g)$

25 $^0C$ උෂ්ණත්වයේදී සිදුවන ඉහත ප්‍රතික්‍රියාව හා සම්බන්ධ දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| | සම්මත උත්පාදන එන්තැල්පිය $\Delta H^{\theta}_{f}$ kJ $mol^{-1}$ | එන්ට්‍රොපිය $S^{\theta}$/J $K^{-1}$ $mol^{-1}$ |
|---|---|---|
| CO (g) | -110.5 | 198.0 |
| $COCl_2$ (g) | -220.0 | 284.0 |
| $Cl_2$ (g) | 0.0 | 223.0 |

i) ඉහත වගුවේ දත්ත භාවිතයෙන් ප්‍රතික්‍රියාවට අදාල එන්තැල්පි විපර්යාසය ගණනය කරන්න.
ii) ප්‍රතික්‍රියාවේ සම්මත එන්ට්‍රොපි වෙනස ගණනය කරන්න.
iii) එනයින් ප්‍රතික්‍රියාවේ ස්වයංසිද්ධතාව පුරෝකථනය කරන්න.

b) පරිමාව $0.5m^3$ වන සංවෘත භාජනයක් තුළ NO(g) 0.4 mol හා $H_2$(g) 0.3 mol ක් 500K උෂ්ණත්වයේදී ප්‍රතික්‍රියා කරවන ලදී. එහිදී පහත දැක්වෙන සමතුලිතතාවය ඇති විය.

$$2NO\ (g) + 2H_2(g) \rightleftharpoons N_2(g) + 2H_2\ O(g)$$

සමතුලිත අවස්ථාවේදී NO(g) 0.15 mol ක් පවතින බව සොයා ගන්නා ලදී.

i) මෙම සමතුලිතය සඳහා $K_C$ ගණනය කරන්න.

ii) එනයින් $K_P$ වල අගය ගණනය කරන්න.

iii) තවත් පරීක්ෂණයක දී NO(g) 0.4 mol , $H_2$(g) 0.3 mol ,$N_2$ (g) 0.5 mol හා $H_2O$(g) 0.2 mol පරිමාව 0.5 $m^3$ ක භාජනයේ අන්තර් ගත කර ඇති විට ප්‍රතික්‍රියාව කුමන දිශාවට සිදුවේ දැයි ගණනය කිරීමක් මගින් පුරෝකතනය කරන්න.

06. a) $CH_3COOH$ නම් දුබල අම්ලය ජලයේදී මෙන්ම B නම් කාබනික ද්‍රාවකයෙහි ද ද්‍රවණය වන අතර B කාබනික ද්‍රාවකය තුළ $CH_3COOH$ සංසට්ටනය හෝ විඝටනය හෝ සිදු නොවේ. ජලය සහ B එකිනෙක සමග සම්පූර්ණයෙන් ම අමිශ්‍ර වේ.

1.0 mol $dm^{-3}$ ජලීය $CH_3COOH$ ද්‍රාවණ 100.0 $cm^3$ ක් සමග B නම් ද්‍රවය 50.0 $cm^3$ දමා හොඳින් සොලවා, එම පද්ධතියට $27^0C$ දී සමතුලිතතාවයට එළඹීමට ඉඩ හරින ලදී. ද්‍රව දෙක අමිශ්‍ර ස්ථර දෙකකට වෙන් වූ අතර අවසානයේ දී ජලීය ස්ථරයේ pH අගය 3.0 ක් බව සොයාගන්නා ලදී. ($27^0C$ දී $CH_3COOH$ හි විඝටන නියතය $2.0\times10^{-6}$mol $dm^{-3}$)

i) ජලීය ස්ථරයෙහි වූ $H^+$ අයන සාන්ද්‍රණය

22 A/L අපි [ papers group ]

ii) ජලීය ස්ථරයෙහි විඝටනය නොවූ $CH_3COOH$ සාන්ද්‍රණය,

iii) B කාබනික ස්ථරයෙහි විඝටනය නොවූ $CH_3COOH$ සාන්ද්‍රණය

iv) $27^0C$ දී ජලය හා B අතර $CH_3COOH$ හි විභාග සංගුණකය ගණනය කරන්න.

b) සාන්ද්‍රණය $0.1\ mol\ dm^{-3}$ වන $Ag^+$ හා සාන්ද්‍රණය $0.01\ mol\ dm^{-3}$ $Ba^{2+}$ අයන අන්තර්ගත එක්තරා ජලීය ද්‍රාවණයකට $K_2CrO_4(s)$ සෙමින් එකතු කරනු ලැබේ. එවිට පරිමා විපරියාසයක් සිදු නොවන්නේ යැයි සලකා ,

i) $Ag_2CrO_4$ හා $BaCrO_4$ අවක්ෂේප වීම ආරම්භ වන අවස්ථාවේදී $[CrO_4^{2-}(aq)]$ සාන්ද්‍රණය ගණනය කරන්න.

ii) එනයින් මුලින් අවක්ෂේප වනුයේ කුමන සංයෝගයද යන්න අපෝහනය කරන්න.

iii) දෙවන අවක්ෂේපය ඇතිවීම ආරම්භ වන විට පළමුවෙන් අවක්ෂේපය වූ සංයෝගයේ කැටායනයේ සාන්ද්‍රණය, ද්‍රාවණය තුළ කොපමණ පවතීදැයි ගණනය කරන්න.

$Ksp\ [Ag_2CrO_4(s)] = 1.2\times10^{-12} mol^3\ dm^{-9}$, $Ksp\ [BaCrO_4(s)] = 1.2\times10^{-10} mol^2\ dm^{-6}$

c) අමිශ්‍ර ද්‍රව 2ක් අතර ද්‍රව දෙකෙහිම දියවන ද්‍රව්‍යයක් ව්‍යාප්තව සමතුලිතාව ඇති විට ඒ සඳහා නන්ස්ට් ව්‍යාප්ති නියමය යෙදීමට සපුරාලිය යුතු අවශ්‍යතා සඳහන් කරන්න.

07. a) A යනු 3d ආන්තරික මූලද්‍රව්‍යයක් වන අතර එහි සුලබ ඔක්සෝ ඇනායන දෙක ආම්ලික මාධ්‍යයේදී ද්විධාකරණය වීමෙන් එක් ඔක්සෝ ඇනායනයක් බවට පත්වේ.

i) A නම් මූලද්‍රව්‍යයේ රසායනික සංකේතය ලියා දක්වන්න.

ii) A වල ඉහළම ඔක්සිකරණ අංකය සහිත අවස්ථාවේදී ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියා දක්වන්න.

iii) A මගින් සාදන ඔක්සයිඩ තුනක රසායනික සූත්‍රය, A වල ඔක්සිකරණ අංකය හා ආම්ලික හා භාස්මික ස්වභාවය ලියන්න.

iv) A වල කැටායන සහිත ජලීය ද්‍රාවණයක් පහත සඳහන් අවස්ථාවලදී පෙන්වනු ලබන නිරීක්ෂණය සඳහන් කරන්න.

I. ජලීය ද්‍රාවණයකදී වර්ණය,

II. A කැටායනය සහිත ජලීය ද්‍රාවණයකට NaOH බිංදු වශයෙන් එකතු කරන විට

III. A හි කැටායන සහිත ජලීය ද්‍රාවණයකට $NH_4OH$ බිංදු වශයෙන් එකතු කල විට,

IV. A හි ජලීය ද්‍රාවණයකට වැඩිපුර NaOH එකතු කර පසුව $H_2O_2$ ස්වල්පයක් එක් කල විට,

v) ඉහත (iv) කොටසෙහි එක් එක් අවස්ථාවේ අදාල රසායනික ප්‍රතික්‍රියාවන් සඳහා තුලිත රසායනික සමීකරණ ලියා දක්වන්න.

vi) A ජලීය ද්‍රාවණයකදී සාදන සංකීර්ණ අයනයේ IUPAC නාමය ලියන්න.

b) ඔබට පහත ද්‍රව්‍ය සපයා ඇත.

Zn කූරක්, Pt කූරක්, $ZnCl_2$ $(1.0\ mol\ dm^{-3})$ ද්‍රාවණ $200\ cm^3$, $Fe^{3+}(1.0\ mol\ dm^{-3})$ ද්‍රාවණ $100\ cm^3$, $Fe^{2+}(1.0\ mol\ dm^{-3})$ ද්‍රාවණ $100\ cm^3$ ක්, U හැඩැති නලයක පුරවන ලද ඒගාර් ජෙලි වල අඩංගු KCl, Cu කම්බියක්, බීකර 2

i) ඉහත ද්‍රව්‍ය භාවිතා කර සාදා ගත හැකි විද්‍යුත් රසායනික කෝෂයක නම් කල රූපසටහනක් අඳින්න.

22 A/L අපි [ papers group ]

ii) මෙම කෝෂයේ (ධාරාවක් ලබා ගන්නා විට)

i. ඇනෝඩ ප්‍රතික්‍රියාව ලියන්න.

ii. කැතෝඩ ප්‍රතික්‍රියාව ලියන්න.

iii. කෝෂ ප්‍රතික්‍රියාව ලියන්න.

iv. මෙම කෝෂයේ සම්මුතික කෝෂ අංකනය ලියන්න

iii) $E^{\theta}Zn_{(s)}/Zn^{2+}_{(aq)} = -0.76V$, $E^{\theta}Fe^{3+}_{(aq)}/Fe^{2+}_{(aq)} = 0.77V$ නම් සම්මත අවස්ථාවේදී විද්‍යුත් ධාරාවක් නොගලන විට කෝෂයේ විද්‍යුත් ගාමක බලය ගණනය කරන්න.

iv) ඉහත කෝෂයේ විද්‍යුත් ගාමක බලය කෙරෙහි බලපාන සාධක හතරක් ලියා දක්වන්න.

v) ඉහත කෝෂය මගින් 2.0 A ක ධාරාවක් යම් කාලයක් තුල ලබාදුන් පසු එහි එක් අර්ධ කෝෂයක $Fe^{3+}_{(aq)}$ සාන්ද්‍රණය $0.3\ mol\ dm^{-3}$ ප්‍රමාණයකින් වැඩි වූයේ නම් කෝෂය මගින් කොපමණ කාලයක් විද්‍යුත් ධාරාවක් ලබා දී තිබේද?

---

C- කොටස රචනා

- ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

---

08. ප්‍රතිකාරක ලැයිස්තුවේ දී ඇති ප්‍රතිකාරක හා දී ඇති කාබනික සංයෝග පමණක් භාවිත කරමින් පහත දී ඇති පරිවර්තනය සම්පූර්ණ කරන්න.




22 A/L අපි [ papers group ]

**ප්‍රතිකාරක ලැයිස්තුව :-**

$Br_2(l)$, සාන්ද $C_2H_5MgBr$, $CH_3OH$, $NaBH_4$ KOH, $H^+/H_2O$, $C_2H_5OH$

b) I) පහත දැක්වෙන පරිවර්තනය පියවර 5කට නොවැඩි සංඛ්‍යාවකින් සිදුකරන ආකාරය දක්වන්න.



II) 


i) X ඵලය හඳුනාගන්න

ii) එම ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය ලියන්න.

iii) එම යාන්ත්‍රණය කුමන වර්ගයට අයත් වේද?

iv) ඉහත ප්‍රතික්‍රියා යාන්ත්‍රණයේ දී ඉවත්වීමේ කාණ්ඩය කුමක් ද?

c) පහත දී ඇති සංයෝගවල වරහන් තුල දී ඇති ගුණය සංසන්දනාත්මකව කෙටියෙන් පහදන්න

(i)  හා $C_2H_5OH$ (ආම්ලිකතාව

(ii) $CH_3CH_2OH$ සහ $CH_3CH_2NH_2$ (භාස්මිකතාව)

09. a) P නම් ද්‍රාවණයක කැටායන 4ක් අඩංගු වේ. එම කැටායන හඳුනාගැනීම සඳහා කරන ලද පරීක්ෂණයක විස්තර පහත දී ඇත.

එහිදී ලැබෙන අවක්ෂේප X ලෙසත් ද්‍රාවණ y ලෙසත් නම් කර ඇත.

| | පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|---|
| 1 | P හි කුඩා කොටසකට තනුක HCl එකතු කිරීම | ද්‍රාවණයේ කිසිදු වෙනසක් නැත. |
| 2 | ඉහත ආම්ලික ද්‍රාවණය තුලින් $H_2S$ බුබුලනය කිරීම | තැඹිලි පැහැති $X_1$ අවක්ෂේපය සෑදීම. |
| 3 | $X_1$ අවක්ෂේපය පෙරා වෙන් කර $H_2S$ ඉවත් වන තුරු ද්‍රාවණය නටවා සිසිල් වූ පසු $NH_4Cl/NH_4OH$ එකතු කිරීම. | ජෙලටනිමය සුදු අවක්ෂේපය $X_2$ සෑදීම. |
| 4 | $X_2$ අවක්ෂේපය පෙරා ඉවත්කර පෙරණය තුලින් $H_2S$ වායුව බුබුලනය කිරීම. | සුදු අවක්ෂේපය $X_3$ සෑදීම. |
| 5 | $X_3$ අවක්ෂේපය පෙරා ඉවත්කර පෙරණය තුල වූ $H_2S$ ඉවත්වන තුරු ද්‍රාවණය නටවා එයට $Na_2CO_3$ එකතු කිරීම. | සුදු අවක්ෂේපය $X_4$ සෑදීම. |

22 A/L අපි [ papers group ]

ඉහත X හි අවක්ෂේපයන් වෙන වෙන ම තනුක HCl අම්ලය සමග ප්‍රතික්‍රියාවට භාජනය කල විට Y අවර්ණ ද්‍රාවණ ප්‍රතිඵල වේ.

| X අවක්ෂේපය | නිරීක්ෂණය |
|---|---|
| $X_1$ | වායුවක් පිටවෙමින් $Y_1$ ද්‍රාවණය ප්‍රතිඵල වේ. |
| $X_2$ | අවක්ෂේපය දිය වී $Y_2$ ද්‍රාවණය සෑදේ. |
| $X_3$ | වායුවක් පිටවෙමින් $Y_3$ ද්‍රාවණය සෑදේ. |
| $X_4$ | වායුවක් පිටවෙමින් $Y_4$ ද්‍රාවණය සෑදේ. |

Y ද්‍රාවණ නැවතත් පහත පරීක්‍ෂා වලට භාජනය කර ලබා ගත් නිරීක්‍ෂණ වන්නේ

| ද්‍රාවණය | පරීක්‍ෂණය | නිරීක්‍ෂණය |
|---|---|---|
| $Y_1$ | වැඩිපුර ජලය සමග ප්‍රතික්‍රියා කරවීම | සුදු අවක්ෂේපය $X_5$ හා ආම්ලික ද්‍රාවණයක් ලැබේ. |
| $Y_2$ | ජලීය NaOH සෙමින් එකතු කිරීම<br>වැඩිපුර NaOH එකතු කිරීම | $X_2$ අවක්ෂ්පය සෑදීම<br>$X_2$ අවක්ෂ්පය දියවීම |
| $Y_3$ | ජලීය NaOH සෙමින් එකතු කිරීම<br>NaOH වැඩිපුර එකතු කිරීම | $X_6$ සුදු අවක්ෂේපය සෑදීම<br>$X_6$ සුදු අවක්ෂේපය දියවීම |
| $Y_4$ | පහන්සිළු පරීක්‍ෂාව | කහ කොළ පැහැති දැල්ලක් ලබා දේ |

i) P ද්‍රාවණයේ වූ කැටායන 4 හඳුනාගන්න. (හේතු දැක්වීම අනවශ්‍යයි)

ii) $X_1$ සිට $X_6$ දක්වා වූ අවක්ෂේප වල රසායනික සූත්‍ර ලියන්න.

iii) $X_2$ හා $X_6$ අවක්ෂේප දෙක එකිනෙකින් වෙන් කර හඳුනාගැනීම සඳහා ක්‍රමයක් යෝජනා කරන්න.

iv) $X_1$ සිට $X_4$ දක්වා වූ අවක්ෂේප වලට තනුක HCl එකතු කිරීමේදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

b) නිශ්ක්‍රිය අපද්‍රව්‍ය සහිත හිමටයිට් ලෝපස් $(Fe_2O_3)$ නියැදියක $Fe_3O_4$ යම් ප්‍රමාණයක් ද අඩංගු වී ඇත. එහි සංශුද්ධතාව නිර්ණය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියා පිළිවෙල අනුගමනය කරන ලදී.

ලෝපස් 8 g නියැදියක් එහි අඩංගු සියළුම යකඩ, $Fe^{2+}$ බවට පරිවර්තනය කිරීම සඳහා ජලීය KI $50\ cm^3$ සමග ආම්ලික මාධ්‍යයකදී පිරියම් කරන ලදී. අනතුරුව ද්‍රාවණය $100\ cm^3$ තෙක් ආසුත ජලය එකතු කර තනුක කරන ලදී. තනුක කරන ලද ද්‍රාවණයේ $25\ cm^3$ ක් සමග ප්‍රතික්‍රියා වීමට $1\ mol\ dm^{-3}$ $Na_2S_2O_3$ $24\ cm^3$ අවශ්‍ය විය.

තනුක කරන ලද ද්‍රාවණයෙන් වෙනත් $25\ cm^3$ කොටසක් $I_2$ මුලුමනින්ම ඉවත් කිරීම සඳහා $CCl_4$ සමග හොඳින් සොලවා අනතුරුව ලැබෙන ද්‍රාවණය $1\ mol\ dm^{-3}$ $KMnO_4$ ද්‍රාවණයක් සමග ප්‍රතික්‍රියා කර වූ විට $KMnO_4$ ද්‍රාවණයෙන් $5.2\ cm^3$ ක් වැය විය.

1. සිදුවන සියළුම ප්‍රතික්‍රියා සඳහා තුලිත සමීකරණ ලියන්න.
2. ලෝපස් වල වූ $Fe_2O_3$ ස්කන්ධ ප්‍රතිශතය සොයන්න.

10. a) පහත ගැලීම් සටහන වැදගත් කාර්මික නිෂ්පාදන ක්‍රියාවලි හා සම්බන්ධ වේ. මෙහි,

(R) - අමුද්‍රව්‍ය  [M] නිෂ්පාදන ක්‍රියාවලිය  △P - ඵලය ලෙස දැක්වේ.




22 A/L අපි [ papers group ]

i) මෙහි $R_1$ යනු ස්වාභාවික ප්‍රභවයක් වන අතර එහි සාමාන්‍ය නම් ලියන්න.

ii) $P_4, P_5, P_6$, හා $P_7$ යන අවසන් ඵල නම් කරන්න.

iii) $P_5$ හා $P_2$ හා $P_3$ යන අතරමැදි ඵල නම් කරන්න.

iv) $M_5$ යනු වියළීම හා සම්පීඩනය නම් $M_1$, $M_2$, $M_3$ හා $M_4$ යන ක්‍රියාවලි නම් කරන්න.

v) මෙහි $M_3$ ක්‍රියාවලියේදී කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා යොදා ගනු ලබන උපක්‍රම 3 ලියන්න.

vi) $P_4$ ඵලයේ සංශුද්ධතාවය සඳහා $M_2$ ක්‍රියාවලියේදී යොදනු ලබන උපක්‍රම මොනවාද?

vii) $M_2$ ක්‍රියාවලිය සඳහා භාවිතා වන වඩාත්ම කර්යක්ෂම ක්‍රමය කුමක් ද?

b) මේ වන විට ලෝක ජනගහනය මිලියන අටක් දක්වා ඉහල ගොස් ඇත. ජනගහනයේ වැඩිවීම සමග ඉන්ධන දහනය ද සීඝ්‍රයෙන් ඉහල යමින් පවතී.

i) ඉන්ධන දහනය හා වාහන භාවිතය හේතුවෙන් පරිසරයට මුදා හරින වායු වර්ග 5 ක් නම් කරන්න.

ii) (i) කොටසෙහි සඳහන් වායු නිසා ඇති විය හැකි පාරිසරික ගැටළු දෙකක් ලියන්න.

iii) ඉහත (ii) කොටසෙහි සඳහන් පාරිසරික ගැටළු සඳහා දායක වන වායු වර්ග පරිසරයට මුදාහැරෙන මිනිස් ක්‍රියාකාරකම් සඳහා තුලිත රසායනික සමීකරණය ද සමග උදාහරණ දෙන්න.

iv) ඉහත (iii) කොටසෙහි සඳහන් එක් එක් පාරිසරික ගැටළුව හේතුවෙන් ජීවින්ට සිදුවන අහිතකර බලපෑම් හතර බැගින් ලියන්න.

v) එම බලපෑම අවම කිරීමට සිදුකල හැකි ක්‍රියාකාරකම් තුනක් බැගින් ලියන්න.

22 A/L අපි [ papers group ]

| period / group | 1* | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | 18 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 H | | | | | | | | | | | | | | | | | 2 He |
| 2 | 3 Li | 4 Be | | | | | | | | | | | 5 B | 6 C | 7 N | 8 O | 9 F | 10 Ne |
| 3 | 11 Na | 12 Mg | | | | | | | | | | | 13 Al | 14 Si | 15 P | 16 S | 17 Cl | 18 Ar |
| 4 | 19 K | 20 Ca | 21 Sc | 22 Ti | 23 V | 24 Cr | 25 Mn | 26 Fe | 27 Co | 28 Ni | 29 Cu | 30 Zn | 31 Ga | 32 Ge | 33 As | 34 Se | 35 Br | 36 Kr |
| 5 | 37 Rb | 38 Sr | 39 Y | 40 Zr | 41 Nb | 42 Mo | 43 Tc | 44 Ru | 45 Rh | 46 Pd | 47 Ag | 48 Cd | 49 In | 50 Sn | 51 Sb | 52 Te | 53 I | 54 Xe |
| 6 | 55 Cs | 56 Ba | 57 La | 72 Hf | 73 Ta | 74 W | 75 Re | 76 Os | 77 Ir | 78 Pt | 79 Au | 80 Hg | 81 Tl | 82 Pb | 83 Bi | 84 Po | 85 At | 86 Rn |
| 7 | 87 Fr | 88 Ra | 89 Ac | 104 Rf | 105 Db | 106 Sg | 107 Bh | 108 Hs | 109 Mt | 110 Ds | 111 Rg | 112 Cn | 113 Nh | 114 Fl | 115 Mc | 116 Lv | 117 Ts | 118 Og |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| lanthanoid series 6 | 58 Ce | 59 Pr | 60 Nd | 61 Pm | 62 Sm | 63 Eu | 64 Gd | 65 Tb | 66 Dy | 67 Ho | 68 Er | 69 Tm | 70 Yb | 71 Lu |
| actinoid series 7 | 90 Th | 91 Pa | 92 U | 93 Np | 94 Pu | 95 Am | 96 Cm | 97 Bk | 98 Cf | 99 Es | 100 Fm | 101 Md | 102 No | 103 Lr |